# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1786/24 – 2012 නොවැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා – 2012.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එල්ඩී/05/2009/අයිආර්/192/193/194.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

පුත්තලම දිස්ත්‍රික්කයේ, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරඹේපත්තුවේ මැදගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අ.ග.පි. 3229 පිඹුරේ පිහිටි ඉඩම් කැබලි හතර (04).

**කැබලි අංක 73**

ඉඩමේ නම: හැලඹගහයාය; හිමිකම් කියන අය: 01. එම්. ඩබ්. ඒ. ධර්මවර්ධන, අසංක හෝටලය, උස්වැව පාර, ආණමඩුව, 02. එම්. ඩබ්. ශ්‍රියානි ධර්මවර්ධන, සමුපකාරය අසල, පුත්තලම් පාර, ආණමඩුව. 03. එම්. ඩබ්. ආර්. ධර්මවර්ධන,12/21, වෙන්දේසිවත්ත, ආණමඩුව. 04. එම්. ඩබ්. මල්ලිකා ධර්මවර්ධන, පුත්තලම් පාර, ආණමඩුව. 05. එම්. ඩබ්. එස්. ධර්මවර්ධන, අංක 653, 2 වන වීදිය, උස්වැව පාර, ආණමඩුව; ප්‍රමාණය: හෙක්. 2.5365.

**කැබලි අංක 75**

ඉඩමේ නම: හැලඹගහයාය හා මැදගමවෙළ; හිමිකම් කියන අය: ඒ. එන්. එම්. බී. වී. හේරත්හාමි, එච් 8 ගම්මානය, මහඋස්වැව; ප්‍රමාණය: හෙක්. 1.1046.

**කැබලි අංක 76**

ඉඩමේ නම: හැලඹගහයාය හා මැදගමවෙළ; හිමිකම් කියන අය: එන්. පී. කේ. කොස්තා, අංක 121, නිතිල් පාර, මූදුකටුව, මාරවිල; ප්‍රමාණය: හෙක්. 1.6616.

**කැබලි අංක 77**

ඉඩමේ නම: හැලඹගහයාය; හිමිකම් කියන අය: එච්. එම්. හේරත් බණ්ඩා, 'චන්ද්‍රවාස', මහඋස්වැව; ප්‍රමාණය: හෙක්. 2.1324.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013.01.15 වැනි දින පූ.භා. 10.00ට ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 ජනවාරි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එම්. සංජීවනී හේරත්,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
ආණමඩුව.

2012 ඔක්තෝබර් මස 31 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 357

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: ප්‍රාලේබ/ඉ/1/2/87.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත මැද කෝරළේ උඩුවගග්ගම්පත්තුව සුළු කොට්ඨාසයේ හල්වතුරකන්ද ගමේ පිහිටි මැනුම්පති විසින් සකස් කරන ලද අ.ග.පි. 492 අතිරේක 01 පිඹුරෙහි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.3513ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 72**

ඉඩමේ නම: එගස්ලැන්ඩ්, හල්වතුරෙකන්දෙ මූකලාන, ඌවැල්ලෙකැලේ, වැලිවිස්සෙකැලේ සහ තොන්ගමලේ මූකලාන; හිමිකම් කියන අය: බලන්ගොඩ වැවිලි සමාගම, තැ.පෙ. 06, ෆාම් ගාඩින්, රත්නපුර; ප්‍රමාණය: හෙක්. 6.3513.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012.11.26 වැනි දින පෙ.ව. 10.00ට බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 නොවැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එස්. ජී. එදිරිසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බළන්ගොඩ.

2012 ඔක්තෝබර් මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 358

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.